

# ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකය

## විධායක සාරාංශය


විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

සෝෂල් ඉන්ඩිකේටර්



පෙබරවාරි 2022

# ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකය, දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙහි නියෝජනයෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) සැදුම්ලත් ප්‍රතිචාර දැක්වූවන් 1223 දෙනකුගෙන් සමන්විත නියැදියක් තුළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් සිදුකරන ලදී. මෙහිදී දිස්ත්‍රික්කය සහ වාර්ගික ජනගහනය මත සලකා නියැදිය තෝරාගැනීම සිදුකරනු ලැබීය. ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන අවස්ථාවේ දී කෝවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස මුහුණදුන් බොහෝ සීමාවන් හේතුවෙන් අප ආයතනය විසින් (සෝෂල් ඉන්ඩිකේටර් - Social Indicator) නියැදියට අවශ්‍යය ප්‍රතිචාර දක්වන්නන් තෝරා ගැනීමේදී ස්නෝබෝල් නියැදි ක්‍රමවේදය භාවිත කරන ලදී. මෙහිදී, තෝරාගත් සම්මුඛ සාකච්ඡාවන් ප්‍රමාණයක් පැවැත්වීමට සමීක්ෂක සඳහා අවස්ථාව ලබා දුන් අතර සුදුසු ප්‍රතිචාරකයෙක් තෝරා ගැනීමේදී පූර්ව කොන්දේසි ලෙස යම් යම් කාණ්ඩයන් සම්බන්ධයෙන් සලකා බැලීම සිදු කෙරුණි. එනම්, ප්‍රදේශය (මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා), වයස සහ ස්ත්‍රී පුරුෂභාවය ආදී කරුණු එහිදී සලකා බැලීය. සියලු සම්මුඛ සාකච්ඡාවන් දුරකථනය භාවිතයෙන් සිදුකළ අතර එහිදී ක්ෂේත්‍ර සමීක්ෂකයන් සහ ප්‍රතිචාරකයන්ගේ මව් භාෂාවෙන් සියලු සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී .

ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සමීක්ෂකයින් හට පර්යේෂණ අධ්‍යයනය, සමීක්ෂක විසින් භාවිත කළයුතු පර්යේෂණ මෙවලම් සහ ක්ෂේත්‍ර ශිල්පීය ක්‍රම පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙන ලදී. එසේම, ක්ෂේත්‍ර සමීක්ෂකයන්ගේ මව් භාෂාවෙන් ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කළේය. සමස්ථ අධ්‍යයනයට ප්‍රථමයෙන්, පර්යේෂණ ක්‍රමයෙහි විශ්වාසනීයත්වය, වලංගුභාවය සහ අනුපිළිවෙල ඇගයීම සඳහා සෝෂල් ඉන්ඩිකේටර් මඟින් පූර්ව පරීක්ෂණයන් සිදු කරන ලද අතර එම ක්‍රමයන් (මෙවලම්) සහ සමස්තයක් ලෙස අධ්‍යයනය සඳහා ප්‍රතිචාරකයන්ගේ කැමැත්ත සහ අවධානය ද ඇගයීමට ලක් කරන ලදී. කෝවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූ විවිධ සීමාවන් සැලකිල්ලට ගනිමින් පර්යේෂණ කණ්ඩායම විසින් ක්ෂේත්‍ර සුපරීක්ෂකවරුන් සඳහා ක්ෂේත්‍ර සාකච්ඡා සූම් තාක්ෂණය ඔස්සේ මාර්ගගතව (ඔන්ලයින්) පවත්වන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු වර්ෂ 2021 සැප්තැම්බර් 19 වන දින සිට ඔක්තෝබර් 16 දින දක්වා පවත්වන ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන ජනවාර්ගික කාණ්ඩායම් හතරේ පිරිමි සහ ගැහැණු යන දෙඅංශයම නියෝජනය කරමින් ක්ෂේත්‍ර සමීක්ෂකයන් 62 ක් සහභාගී වූහ.

එක්රැස් කරන ලද දත්තවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මුලු නියැදියෙන් 10% කට වැඩි ප්‍රමාණයක් තත්ත්වය පරීක්ෂාවට ලක්කරන ලදී. මෙහිදී සැබෑ දිස්ත්‍රික්ක සහ ජනගහනය අනුව ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තැබීම සිදුකර ඇත. එසේම, මෙහි දත්ත සමාජ විද්‍යා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත.

මෙම අධ්‍යයනයේ සමීක්ෂණ කණ්ඩායම ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකිනා මොයිනුඩීන් සහ එම් ක්‍රිෂ්ණමූර්ති යන අයගෙන් සමන්විත විය. එපමණක් නොව, ශෂික් සිල්වා විසින් දත්ත විශ්ලේෂණයට සහය දැක්විය. මෙහිදී මෙම අධ්‍යයනය ක්‍රියාවට නැංවීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් අපි ආචාර්ය පාක්‍යසෝති සරවණමුත්තු මහතාට ස්තුතිවන්ත වෙමු. මෙහි කවරයේ ඡායාරූපය මාත්‍රම් හි (https://maatram.org/ ) කතඃ සෙල්වරාජා රාජසේගර් විසින් ඡායාරූපගත කරන ලද්දකි.

# විධායක සාරාංශය

## රජයේ කාර්යසාධනය පිළිබඳ තත්ත්වය

- සමස්තයක් වශයෙන් ප්‍රතිචාර දැක්වූවන් විශ්වාස කරන පරිදි රජය විසින් අවධානය යොමුකළ යුතු ප්‍රධානතම කාරණා ත්‍රිත්වය වන්නේ, කෝවිඩ්-19 ව්‍යාප්තිය අවම කිරීම (30.3%), ජීවන වියදම ඉහළයාම පාලනය කිරීම (26.1%) සහ ආර්ථික වර්ධනය සහතික කිරීම (25.9 %) ආදියයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගේ සැලකිය යුතු ප්‍රමාණයක් (67.2 %) කෝවිඩ් අර්බුදය සමනය කිරීමේදී කැබිනට් මණ්ඩලයේ කාර්යක්ෂමතාවය පිළිබඳ සෑහීමකට පත් නොවේ. කෙසේ නමුත්, ප්‍රතිචාරකයන් තම ප්‍රදේශයේ සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතාවය පිළිබඳ බොහෝ දුරට සෑහීමකට පත්වන බව පෙනේ.
- ප්‍රතිචාර දැක්වූවන් බහුතරයකගේ (72.1%) මතය වන්නේ රසායනික පොහොර සෞඛ්‍යයට හිතකර නොවන නමුත් පැහැදිලි විසඳුමක් ලැබෙන තුරු රසායනික පොහොර යම් ප්‍රමාණයකට භාවිතා කළයුතු බවයි. නමුත් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 23% කගේ අදහස වූයේ රසායනික පොහොර සෞඛ්‍යයට අහිතකර බැවින් ඒවා භාවිතය සම්පූර්ණයෙන්ම නතර කළ යුතු බවයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 45% කට ආසන්න පිරිසක් ප්‍රකාශ කර සිටියේ සැමදෙනාටම වෙළඳ ප්‍රතිලාභ වැඩිවන බැවින් රජය විසින් විදේශ සමාගම්වලට අපේ රටේ ආයෝජනය කිරීමට ඉඩදිය යුතු බවය. එහෙත් 37.5% ක් පෙන්වා දෙනු ලබන්නේ විදේශීය සමාගම්වල සූරාකෑම හේතුවෙන් රජය විසින් විදේශ ආයෝජනවලට ඉඩ ලබා නොදිය යුතු බවයි.
- පසුගිය ආණ්ඩුව බලයේ සිටි කාලය හා සසඳන විට ප්‍රතිචාරකයන් කියා සිටියේ, නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමේදී අපක්ෂපාතීත්වය, ජනාධිපතිවරයා දේශපාලන නායකයන් සහ හමුදාව හෝ වෙනත් සිවිල් ආරක්ෂක හමුදාවන් විවේචනය කිරීමේ නිදහසෙහි අඩුවීමක් වර්තමානයේ දක්නට ලැබෙන බවයි. එසේම ප්‍රතිචාරකයන් කියා සිටියේ සාමාන්‍ය ජීවන තත්ත්වයෙහි පහත වැටීමක් ද පවතින බවයි.

## රජයේ පොරොන්දු පිළිබඳ තත්ත්වය

- ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් (64.1%) ප්‍රකාශ කර සිටියේ රජය විසින් සිය පාලන කාලය තුළ රට තුළ පවතින වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩග නු ඇතැයි සිතිය නොහැකි බවයි.
- වර්තමාන පාලන ක්‍රමය යටතේ ජාතික ආරක්ෂාව පිළිබඳ සිතන විට ප්‍රතිචාරකයින්ගේ බහුතරයකගේ (60.4%) අදහස වන්නේ රටේ අභ්‍යන්තර ආරක්ෂක තර්ජන වලින් බොහෝ දුරට ආරක්ෂා වනු ඇති බවය. නමුත් 30% ක් පමණ පිරිසක් එම මතයට විරුද්ධව ප්‍රතිචාර දක්වා ඇත.
- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා වන රජයේ සැලසුම් සම්බන්ධයෙන් යම් තරමක සැකයක් පවතින බව පෙනේ. මෙහිදී, ප්‍රතිචාර දැක්වූවන්ගෙ න් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයකගේ අදහස වන්නේ රජය සිය පාලන කාලය තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙනු ලබන්නේ දැයි තමන් නොදන්න බවයි. එසේම 40% කට ආසන්න ප්‍රමාණයකගේ අදහස වී ඇත්තේ එසේ කරනු ඇතැයි සිතිය නොහැකි බවයි.

## පාලන ස්වභාවය පිළිබඳ තත්ත්වය

- මැතිවරණවලින් අපහසුතාවයට (බලපෑමකට) පත් නොවන ශක්තිමත් නායකයෙකු සිටීම සඳහා සැලකිය යුතු සහයෝගයක් ඇති බව පෙනේ.
- තීරණ ගැනීම පිළිබඳ මහජන මතය විශ්ලේෂණය කිරීමේදී, රටට අදාළ සියලුම ප්‍රධාන තීරණ දේශපාලඥයන්ට වඩා විශේෂඥයන් විසින් ගතයුතු බවට වන අදහසට අතිබහුතරය (87.4%) එකඟ වන බව පෙනී යයි.
- ආගමික නායකයන් විසින් තීරණ ගැනීමේදී, බහුතරයක් වූ ප්‍රතිචාරකයන් (76.3%) ගේ අදහස වුයේ සියලු ප්‍රධාන තීරණ ආගමික නායකයන් විසින් ගතයුතු බවට වන මතයට තමන් එකඟ නොවන බවයි.
- ප්‍රතිචාරකයන් අතිබහුතරයක් (92.2%) තමන් විසින් තෝරා පත්කර ගැනීම් මූලධර්ම (Elective Principle) සඳහා සහය දක්වීය.
- ප්‍රතිචාරකයන්ගෙන් හරි අඩක් (50.3%) මතය වුයේ ජනාධිපතිගේ බලතල අඩුකර පාර්ලිමේන්තුවට වැඩි බලතල ලබා දිය යුතු බවයි.
- ජාතික මට්ටමින් බලන කළ, දේශපාලනය පිළිබඳ මනා දැනුමක් නොතිබුණ ද, ආණ්ඩුව තුළ දේශපාලඥයින්ට වඩා විශේෂඥයන් සිටිය යුතු බව, ප්‍රතිචාර දක්වුවන්ගෙන් බහුතරයකගේ (60.7%) අදහස විය.

## හමුදාවේ භූමිකාව පිළිබඳ තත්ත්වය

- රට තුළ පවතින කෝවිඩ් අර්බුදය සමනය කිරීමට හමුදාව ගන්නා උත්සාහයේ ප්‍රතිඵලයක් හේතුවෙන් ඔවුන් කෙරෙහි සමාජය විසින් අතිමහත් සහයෝග යක් දක්වයි. කෙසේ වෙතත්, රට පාලනය කළ යුත්තේ හමුදාව විසින් දැයි ප්‍රතිචාරකයන්ගෙන් විමසූ විට, සැලකිය යුතු බහුතරයක් (70.8%) එයට එකඟ නොවීය.
- අර්බුදකාරී අවස්ථාවක දී නිලධාරී ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමට වඩා හමුදාව විසින් තත්ත්වය කළමණාකරණය කර ගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු සහයෝගයන් ඇති බව පැහැදිලි විය. මෙම මතය සමඟ සුලුතර ජනවාර්ගික ප්‍රජාවේ ප්‍රතිචාරකයන්ට වඩා සිංහල ජනවාර්ගික ප්‍රජාවේ ප්‍රතිචාරකයන් වඩා එකඟවීමක් දක්නට ලැබුණි.
- සිවිල් රාජකාරි ඉටු කිරීම සඳහා ආරක්ෂක හමුදාවන්ගේ කාර්යභාරය පුලුල් වීම සම්බන්ධයෙන් ජාතික වශයෙන් ප්‍රතිචාරකයන්ගේ බහුතරයක් (84.1%) සෑහීමකට පත්වන බව පෙන්නුම් කරන අතර 17.4% ක් පමණ ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවේ.

## සමාජ තත්ත්වය පිළිබඳව

- කුටුම්භ අදායම මත අවධානය යොමු කිරීමේදී ප්‍රතිචාරකයන්ගේ සැලකිය යුතු ප්‍රතිශතයක් (75.1%) කියා සිටියේ ඔවුන්ගේ ගෘහයේ ආදායම නරක අතට හැරී ඇති බවයි. එසේම ප්‍රධාන වශයෙන් උඩරට දෙමළ ප්‍රජාව (63.6%) ප්‍රකාශකර සිටියේ පසුගිය වසර දෙකකට පෙර තත්ත්වය හා සැසදීමේදී ඔවුන්ගේ ගෘහ අදායම බෙහෙවින් නරක අතට හැරී ඇති බවයි.
- වසර දෙකකට පෙර පැවැති තත්ත්වය හා සසඳන විට, පුද්ගලික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රතිචාරකයින්ගෙන් තුනෙන් එකක් කියා සිටියේ ඔවුන්ගේ පුද්ගලික ආරක්ෂාව නරක අතට හැරී ඇති බවයි. එපමණක් නොව බොහෝ දුරට මෙහිදී ප්‍රතිචාර දක්වූ සුලුතර වාර්ගික ප්‍රජාවගේ (මුස්ලිම් 45.4% , දෙමළ 42.7% , උඩරට දෙමළ 42.6%) අදහස වුයේ ආරක්ෂාව පිළිබඳ හැඟීම වසර දෙකකට පෙර පැවැති තත්ත්වය හා සසඳන විට පවතින තත්ත්වය නරක අතට හැරී ඇති බවයි.
- ප්‍රතිචාරකයින් බහුතරයකගේ (68.4%) මතය වී ඇත්තේ කෝවිඩ්-19 පාලනය කිරීම සඳහා රජය විසින් පනවා ඇති රෙගුලාසි දේශපාලන නායකයින් විසින් නිසි ලෙස අනුගමනය නොකළ බවයි.

## කෝවිඩ්-19 රෙගුලාසිවල නීත්‍යනුකූලභාවය පිළිබඳ තත්ත්වය

- ප්‍රතිචාර දක්වූවන්ගේ බහුතරය (75.1%) පෙන්වා දෙනු ලබන්නේ රජය විසින් පනවන ලද රෙගුලාසි කෝවිඩ්-19 පැතිරීම පාලනය කිරීම සඳහා ප්‍රයෝජනවත් වූ බවයි.

## සාධාරණව සැලකිම පිළිබඳ තත්ත්වය

- ප්‍රතිචාර දක්වූවන්ගෙන් බහුතරයක් ( 55 කට ආසන්න පිරිසක්) පෙන්වා දෙනු ලැබුවේ කෝවිඩ්-19 අර්බුදය අවම කිරීම සඳහා රජය විසින් පනවන ලද රෙගුලාසි රටේ සියලුම පුරවැසියන් කෙරෙහි සාධාරණ ලෙස ක්‍රියාත්මක නොවූ බවයි.
- ප්‍රාදේශීය මට්ටමින් රජයෙන් සේවාවන් ලබා ගැනීමේ දී හෝ රජයේ සහනාධාර ලබන විට පොලිසිය, හමුදාව සහ සෞඛ්‍ය බලධාරීන් විසින් කෝවිඩ්-19 රෙගුලාසි ක්‍රියාවට නංවන විට, වෙනස්කොට සැලකීම හෝ අසාධාරණව සැලකීම් දැඩිව අත්විඳ ඇති බව සිංහල ප්‍රජාවේ ප්‍රතිචාරකයන්ට වඩා, වාර්ගික වශයෙන් බොහෝ සුලුතර ප්‍රජාවන්ගේ අත්දැකීම විය.
- සංසන්දනාත්මකව බැලූවිට, උඩරට දෙමළ ප්‍රජාවෙන් සැලකිය යුතු බහුතරයක ප්‍රතිචාර දක්වූවන් (58.8%) පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන්ගේ දේශපාලන පක්ෂ සම්බන්ධකම් හේතුවෙන් රජයේ සහනාධාර ලබා ගැනීමේදී ඔවුනට අසාධාරණයක් සිදු වූ බවයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2081384/+94 11 2081385/ +94 11 2081386
ෆැක්ස්: +94 (11) 2081388
වෙබ්: www.cpalanka.org
විද්‍යුත් තැපැල : info@cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: 6/1බී 1/1 ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 2584050
වෙබ් : www.cpalanka.org/survey-research/
විද්‍යුත් තැපැල: sakina@cpasocialindicator.org